**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය**

---------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

--------------

1.1 **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

-----------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

-------------------------------------------------------

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම් බාරගන්නා බවට පකාශයක් විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.**

1.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

---------------------------

(අ) **විදේශ ගමන් වියදම් රු. 1,796,450 ක අදාල වියදම් ගිණුමේ නොදක්වා දේශන හා සම්මන්ත්‍රණ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.**

(ආ) **පොලොන්නරුව ගොවිපලට අදාලව විභාගවන නඩුවේ රු.60,000 වන්දියක් ඉල්ලුම්කර ඇති නමුත් , ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි.**

1.2.3 **ගෙවියයුතු ගිණුම්**

---------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.**

(අ) 2006 වර්ෂයේ සිට අක්‍රියව පවතින නියෝජිතයින් මගින් කිරි එකතු කිරීමේ කාර්යය සඳහා ලබා ගන්නා ලද ආපසු ගෙවියයුතු තැන්පතු මුදල වූ රු.385,450 ක් නිරවුල් කිරීමකින් තොරව ආපසු ගෙවියයුතු මුදලක් ලෙස දිගින් දිගටම ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) 2006, 2007 හා 2008 වර්ෂ වලදී තැරැව්කරුවන් මගින් පොල් අලෙවි කිරීමේදී ගෙවියයුතුව පවතින තැරැව් ගාස්තු මුදල වූ රු. 3,376,038 ක මුදලක් නිරවුල් නොකර පැවතුණි.

(ඇ) ණයහිමියන් 7 දෙනෙකුට අදාලව 2000 වර්ෂයේ සිට පැවත එන රු.2,106,984 ක ශේෂ නිරවුල් නොකර පැවතුණි.

(ඈ) 2005 වර්ෂයේ සිට පැවත එන පොළොන්නරුව ගොවිපලේ මුරකරුවන් 09 දෙනෙකුගේ වැටුප් වැඩිවීමකට අදාලව ගෙවිය යුතු රු.16,540 ක මුදලක් නිරවුල්කර නොතිබුණි.

(ඉ) 1992 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණු රු.50,000,000 පොලී රහිත ණය මුදල දීර්ඝ කාලයක් තිස්සේ ගිණුම්වල දක්වා තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.4 **ලැබිය යුතු ගිණුම්**

-----------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.**

(අ) පොළොන්නරුව ගොවිපලට අදාලව අවුරුදු 06 ක කාලයක සිට පැවත එන අයනොවන ණයගැති ශේෂවල වටිනාකම රු.168,264 ක් විය.

(ආ) කිරි ව්‍යාපෘතියට අදාලව ණයගැතියන් 13 දෙනෙකුගෙන් රු.418,511 ක මුදලක් අයකරගැනීමට 2008 වර්ෂයේ සිට අපොහොසත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී කිරි අලෙවි සැල්වලින් ප්‍රධාන කාර්යාලය වෙත මුදල් භාරදීමේදී රු.49,500 ක මුදලක් අඩුවෙන් භාරදී ඇති නමුත් 2010 දෙසැම්බර් 31 දින වනවිටද එම මුදල අයකරගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී ගොවිපල තුනක නිෂ්පාදිත කිරි, කිරි ව්‍යාපෘතිය වෙත භාරදීමේදී රු.67,679 ක් වටිනා කිරි ලීටර් 1977.7 ක් අඩුවෙන් භාරදී තිබුණු අතර එම මුදල් අයකරගෙන නොතිබුණි.

(ඉ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය වෙනුවෙන් රු.2,644,404 ක වියදමක් දරා තිබුණද එම මුදල ප්‍රතිපූරණයකරගෙන නොතිබුණි.

(ඊ) වසර 4කට වැඩි කාලයක් නිරවුල් නොවී පවතින ණයගැති ශේෂවල වටිනාකම රු 27,121,209 ක් විය. මෙයින් රු.මිලියන 12 ක් අයකරගැනිමට නඩු පවරා ඇති බව සභාපතිවරයා දැනුම් දී ඇත.

1.2.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම නිසා එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනිමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| වෙළඳ ණයගැතියෝ | 64,607,665 | ශේෂ සනාථ කිරීම් |
| තැන්පතු | 8,504,240 | - එම - |
| ඉදිරියට ගෙවීම් | 1,289,611 | - එම - |
| සියලුම ගොවිපල සතු බැංකු මුදල් | 6,088,042 | (i) බැංකු ශේෂ සනාථ කිරීම්<br>(ii) බැංකු ප්‍රකාශන |
| දියරකිරි ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය | 541,432 | (i) අනුමත ඇස්තමේන්තු<br>(ii) සැලැස්ම<br>(iii) අයවැය ලේඛනය |
| ස්ථාවර වත්කම් විෂයයන් 8 ක් | 496,540,715 | (i) විස්තරාත්මක උපලේඛන<br>(ii) භාණ්ඩ සමීක්ෂණ වාර්තා<br>(iii) යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන |

## 1.2.6 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 16(2) (අ) හා (ආ) වගන්ති | බැංකු අයිරා ලබාගැනීමට පෙර භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගතයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට අනුමැතියකින් තොරව රු.9,264,342 ක බැංකු අයිරා ලබාගෙන තිබුණි.සමාලොචිත වර්ෂයේදී අයිරා පහසුකම් වෙනුවෙන් ගෙවා ඇති පොලිය රු.10,338,708 ක් විය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාද ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 757 (2) දරන මුදල් රෙගුලාසිය | ගොවිපලවල් හැර මණ්ඩලයේ ඉතිරි භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2011 මැයි 06 දින දක්වාම විගණකාධිපතිවෙත ඉදිරිපත්කර නොතිබුණි. |
| (ඇ) අංක පීඊඩී 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| 5.2.5 ජේදය | යාවත්කාලීන කරන ලද ආයතනයේ සමස්ත අනුමත අයවැය ලේඛනය විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| 6.5.1 ජේදය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| 6.5.3 ජේදය | මණ්ඩලය විසින් 2007 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

| | |
|---|---|
| 7.4.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේද විගණන හා කලමනාකරණ කමිටු එකක් පමණක් පවත්වා තිබුණි. |
| 8.3.8 ඡේදය | මණ්ඩලය විසින් බාහිර පාර්ශවයන් වෙත රු.3,144,990 ක් ආධාර වශයෙන් ලබාදී තිබුණි. |
| (ඇ) අංක සීඑස්ඒ/පී/40 හා 2006 ජනවාරි 04 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 2.4 ඡේදය | ගොවිපලවල් සත වාහන 03 ක් විෂයය භාර අමාත්‍යාංශයට අනුමැතියකින් තොරව මුදාහැර ඒ සඳහා රු. 198,600 ක වියදමක් දරා තිබුණි. |
| (ඉ) අංක 353 (5) හා 2004 අගෝස්තු 31 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදය | වාහන කුලියට ගැනීමේදී මාසික කුලිය රු. 40,000 නොඉක්මවියයුතු වුවද ඊට පටහැනිව වාහන 04 ක් කුලියට ලබා ගෙන සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී රු.520,690 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඊ) අංක CSA/P/40 හා 2007 පෙබරවාරි 28 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 3 ඡේදය | දේශීය සංචාරවලදී ආහාරපාන හා නවාතැන් වෙනුවෙන් ගෙවිය යුතු හෝටල් ගාස්තු ආයතනයේ වියදමින් නොදැරිය යුතු වුවද රු1,890,465 ක හෝටල් ගාස්තු මණ්ඩලයේ අරමුදලින් දරා තිබුණි. |

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

----------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.176,463,447 ක ශුද්ධ ලාභයක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.24,561,427 ක් වූයෙන් , මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.151,902,020 ක වර්ධනයක් පෙන්නුම් කෙරණ. ආදායම රු.209,953,271 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය සඳහා මූලික වශයෙන් බලපා තිබුණි.

2.1.2 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

----------------------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) **මණ්ඩලය විසින්** 1995 **වර්ෂයේදී සමාගමක රු.**15,995,170 **ක මුදලක් ආයෝජනය කර තිබුණද සමාගම අලාභ ලැබීම හේතුවෙන් ලාභාංශ නිකුත් කිරීමක් සිදුකර නොතිබුණි. මෙම සමාගම දැනට ඈවර කිරීම සඳහා කටයුතු කර ඇති අතර, එකී සමාගමේ තක්සේරු ගාස්තු හා එහි සභාපතිගේ වැටුප හා විදේශ ගමන් වෙනුවෙන් එකතුව රු.**1,291,250 **ක් මණ්ඩලය විසින් දරා තිබුණි.**

(ආ) **මහබේරිය තැන්න ගොවිපල විකිණිමෙන් ලැබෙන මුදලින් ණය පියවීමේ කොන්දේසය මත** 2003 **වර්ෂයේදී ගොවීන්ගේ භාරකාර අරමුදලින් රු.**102,662,700 **ණය මුදලක් ලබා ගෙන තිබුණි. මණ්ඩලය සතු කිසිදු ගොවිපලක් පුද්ගලීකරණය නොකරන ලෙස අමාත්‍ය මණඩලය විසින් උපදෙස් ලබාදීම නිසා උක්ත ගොවිපල අලෙවි කිරීමක් සිදුනොකරන ලද අතර,ණය මුදලද නිරවුල් කර නොතිබුණි. මෙම ණය මුදල මුල්‍ය තත්වය යහපත් වූ විගස ගෙවීමට කටයුතු කරන බව සභාපති විසින්** 2009 **වර්ෂයේදී විගණනය වෙත දන්වා තිබුණද සමාලෝචිත වර්ෂයේදීද ,එම ණය මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.**

2.2 **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

2.2.1 **ගොවිපල ලාභදායකත්වය**

------------------------------

**ඉකුත් වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් මණ්ඩලය විසින් පශු සම්පත් අභිජනන හා නිෂ්පාදිත ගොවිපලවල්** 30 **හා** 32 **ක් කළමනාකරණය කර ඇති අතර , පහත සඳහන් පරිදි ශුද්ධ ලාභ/අලාභ උපයා තිබුණු බව නිරීක්ෂණය විය.**

| | 2010 | 2009 |
|---|---|---|
| **ලාභ උපයා තිබුණු ගොවිපල සංඛ්‍යාව** | 17 | 19 |
| **ඉපයූ ශුද්ධ ලාභය (රුපියල්)** | 421,584,237 | 245,569,716 |
| **අලාභ ලබා තිබුණ ගොවිපලවල් සංඛ්‍යාව** | 15 | 11 |
| **ඉපයූ ශුද්ධ අලාභය (රුපියල්)** | 80,861,214 | 79,994,261 |

## 2.3 අනාර්ථික ගනුදෙනු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ කටයුතුවලට පරිබාහිරවූ ගෘහස්ත කාර්යයන් සඳහා කම්කරුවන් යොදවා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.220,526 ක වියදමක් දරා තිබුණි.

(ආ) මැතිවරණ කටයුත සඳහා රු.127,286 ක වියදමක් දරා තිබුණි.

## 2.4 හඳුනාගත් පාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බෝපත්තලාව ගොවිපල වෙත භාරදී තිබුණු කිරි අලෙවිසැල් 03 ක් 2010 ජුනි වනවිට වසා දමා තිබුණු අතර එම අලෙවි සැල් 2010 මාර්තු සිට ජුනි දක්වා ලබා ඇති පාඩුව රු.100,587 ක් විය.

(ආ) බෝපත්තලාව ගොවිපල සතු වසා දමන ලද කිරිහල්වල 2010 ජුලි මාසය වනවිට තබුණු රු.10,377 ක් වටිනා කිරි ලීටර් 296.38 ක් සම්බන්ධයෙන් ගොවිපල කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) විවිධ අනතුරු නිසා ජීවිත අහිමි වු වැලිකන්ද ගොවිපලේ සිටි වටිනාකම රු.79,380 ක් වු සතුන් 14 දෙනෙකු පොතෙන් කපාහැර තිබුණි.

(ඈ) ගොවීන්ගේ භාරකාර අරමුදලින් 2003 වර්ෂයේ ලබාගත් ණය මුදල නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතුව පවතින පොලී මුදල රු 10,266,270 ක් විය.

(ඉ) ප්‍රධාන කාර්යාලිය කිරි ව්‍යාපෘතිය වෙත සපයන ලද බෝපත්තලාව ගොවිපලෙහි නිෂ්පාදිත රු.242,160 ක් වටිනා එළුකිරි බෝතල් 4036 ක් නරක් වී තිබුණි.

(ඊ) බෝපත්තලාව ගොවිපහේ නිෂ්පාදිත කිරි ප්‍රධාන කාර්යාලයට යැවීමේදී 2010 මැයි මාසය දක්වා රු.202,020 ක් වටිනා දියරකිරි ලීටර් 5722ක් අඩුවීම් වලට හා නරක් වීම් වලට භාජනය වී තිබුණි.

(උ) කල් ඉකුත්වීමට ප්‍රථම නරක් වී ඇති ඔයාමඩුව ගොවිපලෙහි අලෙවි සැල් නිෂ්පාදන සඳහා මුදල් නොලැබීම නිසා රු.73,344 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඌ) ගොවිපල නිෂපාදිත අලෙවිකිරීම සඳහා පිහිටුවා ඇති ඔයාමඩුව ගොවිපලට අයත් කිරි අලෙවි සැල් 14 ක් සමාලෝචිත වර්ෂයේ ලබා ඇති පාඩුව රු.641,476 ක් විය.

## 2.5 නිශ්කාර්ය වත්කම්

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1992 වර්ෂයේ බෝපත්තලාව ගොවිපලේ ස්ථාපිත කරන ලද සත්ව ආහාර ගබඩා කරන ටොන් 05 ක ධාරිතාවයකින් යුතු ජ්.අයි.සිලින්ඩරාකාර ටැංකි 02 කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ස්ථාපිත කළ වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතුණි.

(ආ) පොලොන්නරුව ගොවිපලේ වර්ග අඩි 6,039ක ගාව ගාල් 07 ක්, වර්ග අඩි 5,940ක ගවගාල් 03 ක් හා විවිධ කාර්යයන් සඳහා භාවිතා කරන ලද ගොඩනැගිලි 09 දීර්ඝ කාලයක සිට පාවිච්චියට ගෙන නොතිබුණි.

(ඇ) පොලොන්නරුව ගොවිපල සතුව ගරා වැටුණු නිවාස 22 ක් පැවතුණු අතර ඒ සම්බන්ධව කිසදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) පරසන්ගස් වැව ගොවිපලෙහි 2007 වර්ෂයේ සිට පරිහරනය නොකර අත්හැර දමා විනාශ වෙමින් පවතින ගොඩනැගිලි සංඛ්‍යාව 11 ක් වු අතර මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 2.6 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව උපදේශකයින් 9 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී රු.475,407 ක දීමනාවක් ගෙවා තිබුණි.

(ආ) මෙම බඳවා ගැනීම් සඳහා සහ කාර්ය මණ්ඩල සංයුතිය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 2.7 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2009 ඔක්තෝබර් 06 දිනැති ලිපිය අනුව මහා භාණ්ඩාගාරයට ගෙවියයුතු රුපියල් මිලියන 10 ක ලාභාංශය ගෙවා නොතිබුණි.

(ආ) `` අවිධිමත් උසස්වීම් - සහකාර සාමාන්‍යාධිකාරි `` යන මැයෙන් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගේ 2009 ජුලි 27 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි එම උසස් කිරීම් විධිමත් කර නොතිබුණි.

(ඇ) **ප්‍රධාන කාර්යාල අලෙවිසැලේ 2009 වර්ෂයෙහි මාස දෙකක් ඇතුලත සිදුවූ රු.900,000 ක භාණ්ඩ හා මුදල් අඩුවීම සම්බන්ධයෙන් අදාල පුද්ගලයින් ගෙන් අයකර නොතිබුණි.**

(ඈ) **කන්තලේ බඩඉරිඟු ව්‍යාපෘතියෙහි ලදුපත් නිකුත් වී ඇති නමුත් නොලැබුණ මුදල වූ රු.30,250 අයකිරීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි**

(ඉ) **2008 දෙසැම්බර් මස බීජ බඩ ඉරිඟු අලෙවි කර ලබාගත් රු.79,750 ක මුදල් අයථා ලෙස පරිහරණය සම්බන්ධයෙන් අදාල නිලධාරීන්ට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොතිබුණි**

(ඊ) **දැදුරු ඔය වාරිමාර්ග ව්‍යාපෘතිය සඳහා නිකවැරටිය ගොවිපලින් අක්කර 04 ක් නිදහස් කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම, එම ඉඩම් ප්‍රමාණය නිත්‍යානුකූලව පවරා දීම හා ස්ථාවර වත්කම් ලේඛනයන් ඉවත් කිරීම සිදුකර නොතිබුණි.**

(උ) **මණ්ඩලය සතු වාහන 04 ක් අමාත්‍යාංශය හා අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා මුදාහැර මණ්ඩලය විසින් රු. 624,670 ක අලුත්වැඩියා වියදම් දරා තිබුණි.**

## 2.8 **අයවැය ලේඛනමය පාලනය**

----------------------------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් වුයෙන් , අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 3. පද්ධති සහ පාලන

--------------------

විගණනයේදි නිරික්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ අවධානය සඳහා යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) හානි හා පාඩු කපාහැරීම්

(ඇ) නිශ්කාර්ය වත්කම්

(ඈ) සේවක කළමනාකරණය

(ඊ) මුල්‍ය කළමනාකරණය

(උ) තොග පාලනය

(ඌ) නිරවුල් කලයුතු ශේෂ